# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2251/49 - 2021 ඔක්තෝබර් මස 29 වැනි සිකුරාදා - 2021.10.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ වන මා විසින් (393 වන අධිකාරය වූ) පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 2 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාර 2021 පෙබරවාරි මස 24 වන දින අංක : 2216/14 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කෙරුණු නිවේදනයෙන් 2021 පෙබරවාරි මස 24 වන දින පිහිටුවන ලද "ශ්‍රී ලංකා රේගුව සම්බන්ධයෙන් එල්ලවන විවිධ චෝදනා හා සිදුවෙතැයි සැලකෙන දූෂිත ක්‍රියා හා අක්‍රමිකතා පිළිබඳව විමර්ශනය කිරීම, පරීක්ෂා කිරීම හා වාර්තා කිරීම සඳහා වන ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවෙහි" තත් කාර්යයන් ඉටුකර එහි අවසන් වාර්තාව ඉදිරිපත් කළ යුතු වන්නා වූ 2021 මැයි මස 30 වන දිනෙන් අවසන් වන කාලය, එකී පනතෙහි 4 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2021 මැයි මස 29 වැනි දින අංක 2229/10 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කෙරුණු නිවේදනයක් මගින් 2021 මැයි මස 30 වන දින සිට මාස පහකින්, එනම් 2021 ඔක්තෝබර් මස 31 වන දින දක්වා දීර්ඝ කරන ලදුව, නැවත වතාවක් එකී බලතල ප්‍රකාරවම 2022 පෙබරවාරි මස 28 වන දින දක්වා මෙයින් දීර්ඝ කරමි.

**ගෝඨාභය රාජපක්ෂ,**
ජනාධිපති.

2021 ඔක්තෝබර් මස 29 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.


1A - G 34910 — 370 (2021/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*